# 2015 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව

# දැක්ම

තිරසාර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක්
ස්ථාපිතවීම සහතික කිරීම

# මෙහෙවර

රජයේ පුළුල් සංවර්ධන ක්‍රියාරාමුව තුළ
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය
සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

# කාර්යයන්

- පෞද්ගලික, රාජ්‍ය  සහ ජාත්‍යන්තර නියෝජිතයන් සම්බන්ධීකරණය කරමින් මැදිකාලීන අයවැය රාමුවක් තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම;

- බදු ප්‍රතිපත්ති සහ ඊට අදාළ අනෙකුත් අණපනත් සකස් කිරීම, (තීරු බදු සහ විශේෂ  වෙළෙඳ භාණ්ඩ බද්ද හැර);

- රාජ්‍ය ආදායම් සහ ලැබීම් ඇතුළත්ව රාජ්‍ය මූල්‍ය පෙළගැස්ම සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය කළමනාකරණය සහ නිරීක්ෂණය;

- සියලුම වාර්තාකරණයන් ඇතුළත්ව 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ක්‍රියාත්මක කිරීම.

# පටුන

පිටුව


1. රාජ්‍ය මූල්‍ය ප්‍රවණතාවයන් - 2015 01

2. 2015 වර්ෂයේ කාර්ය සාධනය 07

3. පාලන හා ගිණුම් 14

## 1. රාජ්‍ය මූල්‍ය ප්‍රවණතාවයන් - 2015

### 1.1 සමාලෝචනය

රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය පවත්වා ගැනීම සඳහා රජය කැපවීමෙන් කටයුතු කළ ද, 2015 වසරේ දී පැවති දේශීය සහ ජාත්‍යන්තර ආර්ථික තත්ත්වයන් හමුවේ මෙම ක්‍රියාවලිය තවදුරටත් අභියෝගාත්මක විය. අඩු ආදායම් පදනමත් සමඟ අපේක්ෂිත මට්ටමට වඩා රාජ්‍ය ආදායමෙහි කාර්යසාධනය මන්දගාමී වීම, ඉහළ යමින් පවතින අනම්‍ය වර්තන වියදම සහ අධ්‍යාපන හා සෞඛ්‍ය යනාදී අංශ වලින් සම්පත් සඳහා ඉහළ ඉල්ලුමක් ඇතිවීම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය කෙරෙහි පීඩනයක් එල්ල කරන ලදී. 2015-2018 මධ්‍ය කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව මගින් 2015 වසරේ දී අයවැය හිඟය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5.6 දක්වා අඩු කිරීමට අපේක්ෂා කළ ද, 2015 වසරේ රාජ්‍ය මූල්‍ය ඉලක්ක වල සැලකිය යුතු අපගමනයක් පෙන්නුම් කර ඇත. ඒ අනුව, 2014 වසරේ ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5.7 ක් ලෙස පැවති අය වැය හිඟය 2015 වසරේ සියයට 7.4 දක්වා ප්‍රසාරණය වන ලදී. අඩු බදු ආදායම, රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි වීම, විශ්‍රාම වැටුප් ගෙවීම්, ඉහළ පොළී ගෙවීම් සහ සංක්‍රාම ගෙවීම් හේතුවෙන් වර්තන වියදමේ වැඩිවීම මෙම අපගමනයට හේතු විය. අයවැය හිඟය ප්‍රධාන වශයෙන් දේශීය මූලාශ්‍ර (සියයට 71.5) මඟින් මූල්‍යයනය කරන ලදී. 2015 වසරේ දී විදේශ මූල්‍යයනය සමස්ත මූල්‍යයනයෙන් සියයට 28.5 දක්වා අඩුවිය. මෙම තත්ත්වයන් සමඟ, 2014 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 70.7 ක් වූ රාජ්‍ය ණය 2015 වසරේ දී සියයට 76.0 ක් දක්වා වැඩි වීම රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය තවදුරටත් අසීරු කරන්නක් විය. මේ අතර, ආර්ථික වර්ධන වේගයත් සමඟ අනුගතව ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස බදු ආදායම වැඩි කර ගැනීමේ අභිලාශයෙන් බදු සහන තාර්කීකරණය කිරීම, බදු ව්‍යුහය සරල කිරීම, බදු පදනම පුළුල් කිරීම සහ බදු පරිපාලනය ශක්තිමත් කිරීම වැනි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් 2015 වසරේ දී රජය විසින් ක්‍රියාත්මක කරන ලදී.

බදු පරිපාලනයේ සහ ප්‍රතිපත්තිමය ක්ෂේත්‍රයන්ගේ අඛණ්ඩ ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් ලෙස රජයේ ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස පසුගිය වසර කිහිපයක් තිස්සේ අඛණ්ඩව අඩු වීමේ ප්‍රවණතාවය බිඳ දමමින් 2015 වසරේ දී මෙම ප්‍රතිශතයෙහි වැඩිවීමක් සිදු වන ලදී. 2014 වසරේ දී සියයට 11.4 ක් වූ මෙම අනුපාතය, 2015 වසරේ දී සියයට 13.0 දක්වා වර්ධනය වී ඇති අතර, බදු ආදායම ද ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 10.1 සිට 2015 වසරේ දී සියයට 12.1 දක්වා වර්ධනය විය. මෙම වර්ධනය සඳහා උපයා ගත් ලාභ මත එක්වරක් පමණක් අය කරනු ලබන සුපිරි වාසි බද්දෙන් (Super Gain Tax) රැස් කරන ලද රු. බිලියන 50 ක ආදායම ද, මෝටර් රථ ආනයන මත පනවන ලද නිෂ්පාදන බදු ආදායමේ වැඩිවීම ද මෙයට හේතුවිය. එසේ වුවත්, බදු නොවන ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සැලකිය යුතු මට්ටමකින් 2014 වසරේ පැවති සියයට 1.4 සිට 2015 වසරේ දී සියයට 0.9 දක්වා අඩු වී තිබේ. නාමික වශයෙන්, 2015 වසරේ රජයේ ආදායම, 2014 දී වාර්තා වූ රු. බිලියන 1,195.2 ක සිට රු. බිලියන 1,454.9 ක් දක්වා එනම් සියයට 21.7 කින් වර්ධනය වී ඇත. 2015 වසරේ දී සමස්ත බදු ආදායම 2014 වසරේ වාර්තා වූ රු. බිලියන 1,050.4 සිට 2015 වසරේ දී රු. බිලියන 1,355.8 දක්වා සැලකිය යුතු ලෙස සියයට 29.1 කින් වැඩි වී ඇත.

රජයේ සමස්ත වියදම සහ ශුද්ධ ණයදීම් ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ දී වාර්තා වූ සියයට 17.2 ට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 20.5 ක් දක්වා වර්ධනය වී ඇත. මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් 2015 වසරේ වර්තන වියදම, ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ දී වාර්තා වූ සියයට 12.7 සිට සියයට 15.2 ක් දක්වා වැඩිවීම හේතු විය. වර්තන වියදම් වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් රාජ්‍ය සේවකයන්ගේ වැටුප්, පොලී ගෙවීම්, සුබසාධන වියදම් හා සංක්‍රාම වියදම්වල වැඩිවීම බලපාන ලදී. නාමික අගය සලකා බලන විට, වර්තන වියදම 2014 වසරේ දී වාර්තා වූ රු. බිලියන 1,322.9 සිට 2015 වසරේ දී රු. බිලියන 1,701.7 දක්වා සියයට 28.6 කින් වැඩි විය. එහි ප්‍රතිඵලයක් ලෙස ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස ආදායම් හිඟය ද 2014 වසරේ පැවති සියයට 1.2 සිට 2015 වසරේ දී සියයට 2.2 ක් දක්වා වැඩි වී ඇත. ඒ අතර, ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණයදීම් නාමික අගයෙන් රු. බිලියන 588.7 දක්වා සියයට 24.5 කින් වර්ධනය වී ඇති අතර, එය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ පැවති සියයට 4.5 සිට 2015 වසරේ දී සියයට 5.3 දක්වා වැඩි වී ඇත. ඊට අමතරව, ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආයෝජන 2014 වසරේ පැවති සියයට 4.7 සිට 2015 වසරේ දී සියයට 5.4 ක් දක්වා මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2015 වසරේ ඉලක්කගත සමස්ථ අයවැය හිඟය රු. බිලියන 516 ට සාපේක්ෂව රු. බිලියන 829.5 ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය වන ලදී.

### 1.2 රාජ්‍ය ආදායම

2014 වසරේ දී ද.දේ.නි යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 11.4 ක්ව පැවති මුළු රාජ්‍ය ආදායම 2015 වසරේ දී සියයට 13.0 දක්වා වැඩි වී ඇති අතර, පසුගිය වසරේ දී ද.දේ.නි යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 10.1 ක්ව පැවති බදු ආදායම සියයට 12.1 දක්වා වැඩි වී ඇත. කෙසේ වෙතත්, 2014 වසරේ දී ද.දේ.නි යෙහි ප්‍රතිශතයක් වශයෙන් සියයට 1.4 ක් ව පැවති බදු නොවන ආදායම 2015 වසරේ දී සියයට 0.9 දක්වා අඩු වී ඇත. 2015 වසරේ දී එකතු කළ මුළු ආදායමේ නාමික අගය 2014 වසරේ වූ රු. බිලියන 1,195.2 ට සාපේක්ෂව රු. බිලියන 1,454.9 දක්වා සියයට 21.7 කින් වර්ධනය වී ඇත.


#### බදු ආදායම

රජය විසින් ලාභ මත එක්වරක් පමණක් අය කරනු ලබන සුපිරි වාසි බද්ද (SGT) පැනවීම සහ මෝටර් රථ ආනයන මත පනවන ලද නිෂ්පාදන බදු ආදායම වැඩිවීම නිසා 2014 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 10.1 ක් ව පැවති රජයේ බදු ආදායම 2015 වසරේ දී සියයට 12.1 දක්වා වර්ධනය විය. රජයේ මුළු ආදායමට බදු ආදායමෙහි දායකත්වය 2014 වසරේ දී සියයට 87.9 ක් ව පැවති 2015 වසරේ දී එය සියයට 93.2 දක්වා වර්ධනය විය. 2014 වසරේ වාර්තා වූ රු. බිලියන 298 ක් වූ දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු ආදායම 2015 වසරේ දී රු. බිලියන 347.6 දක්වා සියයට 16.7 කින් වර්ධනය වී ඇති අතර, මෝටර් රථ සහ ආහාර ද්‍රව්‍ය ඇතුළුව පාරිභෝගික භාණ්ඩ ආනයනය ඉහළ යාම හේතුවෙන් ආනයන බදු, විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද සහ වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද වැනි ආනයනය මත පදනම් වූ බදු ආදායම සියයට 36.7 කින් වර්ධනය විය. මේ අතර සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු වලින් උපයන ලද ආදායම රු. බිලියන 167.3 දක්වා සියයට 67.2 කින් වර්ධනය වී ඇත්තේ 2015 වසරේ දී ලාභ ඉපයීම් මත පනවන ලද එක්වරක් පමණක් ගෙවිය යුතු බද්දෙන් ලද රු. බිලියන 50 ක ආදායම ද සමඟය. එමෙන්ම වැටුප් වැඩි වීම හේතුවෙන් උපයන විට ගෙවීමේ බද්දෙන් ලද ආදායම රු. බිලියන 22.3 සිට රු.

බිලියන 26.2 දක්වා සියයට 17.5 කින් වර්ධනය වී ඇත. එසේ වුවද, 2015 වසරේ දී භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර නිකුතුව අඩුවීම පිළිබිඹු කරමින් පොළී මත බදු ආදායම රු. බිලියන 62.9 දක්වා සියයට 9.6 කින් අඩු වී ඇති අතර, ආර්ථික සේවා ගාස්තු බද්දෙන් ලද ආදායම රු. බිලියන 6.1 දක්වා සියයට 0.1 කින් අඩු වී තිබේ.

**බදු නොවන ආදායම**

මහ බැංකුවේ ලාභ නොලැබීම සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගෙන් ලැබෙන ලාභ හා ලාභාංශවල අඩුවීම හේතුවෙන් 2014 වසරට සාපේක්ෂව 2015 වසරේ බදු නොවන ආදායම රු. බිලියන 99.1 ක් දක්වා සියයට 31.6 කින් අඩු වී ඇත. මෙම පහළ යාම නිසා 2014 වසරේ දී ද.දේ.නි. සියයට 1.4 ක් ව පැවති බදු නොවන ආදායම 2015 වසරේ දී සියයට 0.9 දක්වා පහත වැටුණි.




වගුව 1: රාජ්‍ය ආදායමේ විචලතා විශ්ලේෂණය - 2015 (රු.මිලි.)

| අයිතමය | 2014 | 2015 (ඇස්ත.) | 2015 (තාවකා.) | බලපාන ලද කරුණු |
|---|---|---|---|---|
| ආදායම් බදු | 198,115 | 252,600 | 262,583 | සුපිරි වාසි බද්ද මඟින් රැස්කළ ආදායම හේතුවෙන් 2015 වර්ෂයේ ආදායම් බදු ආදායම ඇස්තමේන්තුගත ආදායම අභිබවා යෑමට සමත් විය. සංචාරක ව්‍යාපාරය, තොරතුරු තාක්ෂණ සහ වෘත්තිය සේවා ආදි ඉහල ආදායම් උපයන කාණ්ඩයේ සේවා නියුක්තිය ඉහල යාම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් ඉහල නැංවීම හේතුවෙන් උපයන විට ගෙවීමේ බදු සැලකිය යුතු ලෙස ඉහල යන ලදී. කෙසේ වුවද, පොළී අනුපාත හා රජයේ සුරැකුම් නිකුතුව |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සාපේක්ෂව අඩු මට්ටමක පැවතීම හේතුවෙන් පොළී මත ආදායම පහළ ගොස් ඇත. |
| එකතු කළ අගය මත බදු | 275,350 | 230,000 | 219,700 | ආනයන මත හා දේශීයව එකතු කළ අගය මත බදු (එ.අ.බ.) ආදායමේ ඒකාබද්ධ බලපෑම හේතුවෙන් එකතු කළ අගය මත බදු ආදායම පහළ ගොස් ඇත. මෙම පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් 2015 වර්ෂයේ ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 12 ක්ව පැවති වැට් බදු ආදායම සියයට 11 දක්වා පහත හෙලීම, සිගරට්, මත්පැන් සහ මෝටර් රථවාහන සඳහා අදාල වූ වැට් බදු සහ අනෙකුත් බදු කිහිපයක් අහෝසි කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමත් ඒ වෙනුවට මෙම භාණ්ඩ සඳහා නිෂ්පාදන බදු පැනවීමත් ප්‍රධාන වශයෙන් බලපාන ලදී. එමෙන්ම එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචිවීමේ සීමාව වර්ෂයකට රු. මිලි 12 සිට රු. මිලි 15 දක්වා ඉහල දැමීම වැට් බදු ආදායම මත සෘණාත්මක බලපෑමක් සිදුකරන ලදී. |
| නිෂ්පාදන බදු හා සුරා බදු | 256,690 | 469,035 | 497,623 | බදු අනුපාත ඉහල දැමීම, අනෙකුත් බදු කිහිපයක් වෙනුවට නිෂ්පාදන බද්ද පැනවීම, වැඩිදියුණු වූ දේශීය නිෂ්පාදනය, ආනයන ඉහළ යාම ආදිය නිෂ්පාදන බද්ද මඟින් එකතු කළ ආදායම සැලකියයුතු මට්ටමකින් ඉහළ යාමට හේතුවිය. ජපන් යෙන් අවප්‍රමාණය වීම සහ සාපේක්ෂව අඩු පොළී අනුපාත පැවතීමේ වාසිය ලබාදීම පිණිස දෙමුහුන් හා විදුලියෙන් ක්‍රියාකරන මෝටර් රථ වාහන වල මෙන්ම ඝණ සෙන්ටිමීටර් 1,000 ට වඩා අඩු ධාරිතාවයෙන් යුත් මෝටර් රථ සඳහා වූ බදු අනුපාත සංශෝධනය කිරීම හේතුවෙන් නිෂ්පාදන බදු ආදායම ඉහළ යන ලදී. අනෙක් අතට සැර අඩු සහ සැර වැඩි මත්පැන් වල නිෂ්පාදනය ඉහළ යාම, බදු අනුපාත ඉහළ දැමීම, ජාතිය ගොඩනැගීමේ බදු හා එකතු කළ අගය මත බදු වෙනුවට නිෂ්පාදන බද්ද හඳුන්වාදීම මත්පැන් මත වූ අදායම ඉහළ යාම සඳහා දායක විය. |
| ආනයන බදු | 81,108 | 92,000 | 132,189 | ජාතිය ගොඩනැගීමේ බදු හා එකතු කළ අගය මත බදු (ආනයනික භාණ්ඩ කීපයක් සඳහා) ආනයන බදු තුළට අන්තර්ග්‍රහණය කිරීම, පරිභෝජන භාණ්ඩ ආනයනය ඉහළ යාම සහ බදු අනුපාත ඉහල දැමීම නිසා ආනයන බදු |


| | | | | |
|---|---|---|---|---|
| | | | | ආදායම ඇස්තමේන්තු කළ ආදායමෙන් සියයට 143.7 ක් ලෙස කැපී පෙනෙන වර්ධනයක් අත්කරගන්නා ලදී. |
| වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු | 68,646 | 55,000 | 58,644 | පාරිභෝජන භාණ්ඩ ආනයනය ඉහළයාම වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු ආදයම ඇස්තමේන්තුගත ආදායමට වඩා ඉහළ යාමට උපකාරී විය. කෙසේ වුවද, මෝටර් රථ වාහන මත පනවා තිබූ වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු අහෝසි කිරිම ආදායම අඩුවීමට දායක විය. |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 44,583 | 48,000 | 45,004 | දුම්කොළ හා මත්පැන් මත පනවා තිබූ ජාතිය ගොඩනැගීමේ බද්ද හා අනෙකුත් බදු කිහිපයක් අහෝසි කිරීම හේතුවෙන් දේශීය ක්‍රියාකාරකම් මත අයකරනු ලබන ජාතිය ගොඩනැගීමේ බද්ද පහළ යන ලදී. කෙසේ වුවද, සිල්ලර වෙළඳාම හා බෙදාහැරීම, සේවා සහ බදු කුලී සහ භාණ්ඩ නිෂ්පාදනයේ ඇති වූ ඉහළ කාර්යසාධනය, මූල්‍ය සේවාවන් ජාතිය ගොඩනැගීමේ බදු පදනම යටතට ඇතුලත් කිරීම, පාරිභෝගික භාණ්ඩ ආනයනය ඉහළ යාම හේතුවෙන් ආනයන මත අයකරනු ලබන ජාතිය ගොඩනැගීමේ බද්ද ඉහළ ගොස් ඇත. |
| අනිකුත් බදු | 125,870 | 146,065 | 140,037 | සිමෙන්ති, ටයිල්, මුද්‍රිත හෝ වර්ණ ගැන්වූ වියන ලද රෙදි ආදියෙහි ආනයන ඉහළ යාම හේතුවෙන් ආනයන මත අයකරනු ලබන සෙස් බදු ආදායම වැඩි වූ අතර, තේ හා රබර් ආදි නිෂ්පාදන වල ඉල්ලුම පහත වැටීම හේතුවෙන් අපනයන මත අයකරනු ලබන සෙස් ආදායම පහත වැටී ඇත. සමහර අයිතම සඳහා අයකරනු ලබන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාතයන් ඉහළ දැමීම සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු යටතට ගැනෙන භාණ්ඩ ප්‍රමාණය ඉහළ යාම හේතුවෙන් විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ කාර්ය සාධනය වැඩිදියුණු විය. නව සබඳතා හා භාවිතය ඉහල යෑම තුළින් විදුලි සංදේශ බදු ආදායම වැඩිවිය. කෙසේ වුවද, ඉදිකිරීම් කර්මාන්තයේ ඇති වූ සාපේක්ෂව අඩු වර්ධනය, කොටස් වෙළෙඳපොළේ වාර්තා වූ පහළ කාර්ය සාධනය ආදිය මධ්‍යයේ වුවද අනෙකුත් බදු යටතේ රැස්කළ ආදායම ඇස්තමේන්තුගත ආදායමින් සියයට 96 ක ප්‍රමාණයක් ළඟාකර ගැනීමට සමත් වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| බදු නොවන ආදායම | 144,844 | 135,500 | 99,099 | පොලී අනුපාත හා රජය සතු වාණිජ ව්‍යාපාර මඟින් ලැබෙන ලාභ හා ලාභාංශ ආදායම පහළ යෑම හා මහ බැංකු ලාභ අනුපාත නොලැබීම හේතුවෙන් බදු නොවන ආදායම සැලකියයුතු ලෙස පහළ ගොස් ඇත. කෙසේ වුවද, සමාජ ආරක්ෂණ දායකත්වය හා විකිණුම් හා ගාස්තු මඟින් ලැබෙන ආදායම ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත. |
| **එකතුව** | **1,195,206** | **1,428,200** | **1,454,879** | |

## 2. 2015 වසරේ කාර්ය සාධනය

### 2.1. ආදායම් රැස් කිරීමේ කාර්යයෙහි නිරත සියලු දෙපාර්තමේන්තු සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් රජයේ ආදායම් වර්ධනය කර ගැනීමට ක්‍රියා කිරීම

බදු සහ බදු නොවන ආදායම් වලින් සමන්විත වූ රජයේ මුළු ආදායම, නාමික වශයෙන්, 2014 දී වාර්තා වූ රු. බිලියන 1,195.2 ක සිට 2015 වසරේ දී රු. බිලියන 1,454.9 ක් දක්වා එනම් සියයට 21.7 කින් වර්ධනය වී ඇත. 2015 වසරේ ලැබූ සමස්ත රාජ්‍ය ආදායම රු. බිලියන 1,355.8 ක් වූ බදු ආදායමෙන් සහ රු. බිලියන 99.1 ක් වූ බදු නොවන ආදායමෙන් සමන්විත වේ.




### 2.2 රාජ්‍ය ආදායම් සාරාංශය

වගුව 2: රාජ්‍ය ආදායම් (රු. මිලි.)

| අයිතමය | 2014 | 2015 |
|---|---|---|
| **බදු ආදායම** | **1,050,362** | **1,355,779** |
| ආදායම් බදු | 198,115 | 262,583 |
| එකතු කළ අගය මත බදු | 275,350 | 219,700 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 44,583 | 45,004 |
| නිෂ්පාදන බදු | 256,691 | 497,623 |
| ආනයන බදු | 81,108 | 132,189 |
| වරාය හා ගුවන් තොටුපොල සංවර්ධනබදු | 68,646 | 58,644 |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු | 47,953 | 52,276 |
| අනෙකුත් | 77,916 | 87,760 |
| **බදු නොවන ආදායම** | **144,844** | **99,099** |

| | | |
|---|---|---|
| පොලී / කුලී | 13,647 | 7,321 |
| ලාභ සහ ලාභාංශ | 46,814 | 29,798 |
| විකුණුම් සහ ගාස්තු | 35,499 | 44,632 |
| සමාජ ආරක්ෂණ දායකත්වය | 14,919 | 15,213 |
| මහ බැංකු ලාභ පැවරුම් | 11,500 | - |
| අනෙකුත් | 22,466 | 2,135 |
| **මුළු ආදායම** | **1,195,206** | **1,454,878** |

## 2.3. රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට අනුකූලව බදු සම්බන්ධ නීතීන්ට සිදු කරන ලද සංශෝධන

**රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මගින් 2015 වර්ෂය තුළදී ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදන පහත දැක්වේ.**

**I. නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත**

- **1989 අංක 13 දරන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත, (2015.01.29 දිනැති අංක 1899/31 දරන ගැසට් නිවේදනය)**
  - සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටිමීටර 1,000 ට අඩු මෝටර් රථ හා විද්‍යුත් මෝටර් රථ සඳහා වන නිෂ්පාදන බදු අනුපාතය අඩු කිරීම සහ දෙමුහුන් වර්ගයේ මෝටර් රථ සඳහා වූ නිෂ්පාදන බදු අනුපාතයන් ඉහළ දැමීම.

- **1989 අංක 13 දරන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත, (2015.02.26 දිනැති අංක 1903/39 දරන ගැසට් නිවේදනය)**
  - ඝන සෙන්ටිමීටර 1,000 ට අඩු දෙමුහුන් විද්‍යුත් වාහන සඳහා අදාල වන නිෂ්පාදන බදු අනුපාතය සංශෝධනය කරන ලද අතර, බස් රථ සඳහා නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්දක් පැනවීම.
  - 2015.03.31 දින හෝ පෙර ලියාපදිංචි කරන ලද වාහන සහ 2015.01.29 දින හෝ පෙර ණයවර ලිපි විවෘත කර ඇති පෞද්ගලික පරිහරණය සඳහා ආනයනය කරන ලද ඝන සෙන්ටිමීටර 2,500 ට අඩු දෙමුහුන් වර්ගයේ මෝටර් රථ වාහන මත අයකරනු ලබන නිෂ්පාදන බද්ද ගෙවීම සඳහා විශේෂ විධි විධාන ලබා දීම.

- **1989 අංක 13 දරන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත, (2015.04.20 දිනැති අංක 1911/2 දරන ගැසට් නිවේදනය)**
  - 2015.03.31 දින වන විට ශ්‍රී ලංකා රේගුව මගින් නිදහස් කරන ලද සහ අතුරු අය වැයට පෙර ණයවර ලිපි විවෘත කරන ලද, සහ පෞද්ගලික පරිහරණය සඳහා ආනයනය කරන ලද වාහන සඳහා අතුරු අයවැයට පෙර අදාල වූ නිෂ්පාදන බදු අනුපාතය ගෙවීම සඳහා ලියාපදිංචි වීමේ කාලය 2015.04.30 දක්වා දීර්ඝ කරන ලදී.

- **1989 අංක 13 දරන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත, (2015.10.02 දිනැති අංක 1934/40 දරන ගැසට් නිවේදනය)**
  - සිගරට් සඳහා වූ නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද ඉහළ නැංවීම.

- **1989 අංක 13 දරන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත, (2015.11.20 දිනැති අංක 1941/29 දරන ගැසට් නිවේදනය)**

- මෝටර් රථ වාහන සඳහා වන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු අනුපාතයන් සංශෝධනය කරන ලද අතර, ඝන සෙන්ටිමීටර මත පදනම්ව මෝටර් රථ වාහන සඳහා අයකරනු ලබන නිෂ්පාදන බදු සඳහා සරල ඒකක අනුපාතයක් හඳුන්වා දීම.

- **1989 අංක 13 දරන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත, (2015.11.20 දිනැති අංක 1941/30 දරන ගැසට් නිවේදනය )**
  - ඒකාබද්ධ අරමුදල් භාවිතා කරමින් සෘජු මිලදී ගැනීම තුළින් හෝ මූල්‍ය කල්බදු පහසුකම් යටතේ රාජ්‍ය ආයතන විසින් මිලදී ගනු ලබන මෝටර් වාහන සඳහා ලබාදුන් බදු නිදහස ඉවත් කිරීම.

## II. සුරා බදු ආඥාපනත

- **සුරා බදු නිවේදන අංක 974 (2015.02.13 දිනැති අංක 1901/19 දරන ගැසට් නිවේදනය)**
  - තොග හා සිල්ලර අලෙවිසැල්, හෝටල්, හෝටල් පිඨිකා,තානායම් ආදියෙහි වාර්ෂික මත්පැන් බලපත් ගාස්තු සංශෝධනය කිරීම.
- **සුරා බදු නිවේදන අංක 975, 976, 977 ( 2015.10.02 දිනැති අංක 1934/41 දරන ගැසට් නිවේදනය)**
  - බියර් සහ සැර මත්පැන් මත අයකරනු ලබන සුරාබදු අනුපාතය ඉහළ නැංවීම.

- **සුරා බදු නිවේදන අංක 978, 979, 980 ( 2015.11.20 දිනැති අංක 1941/31 දරන ගැසට් නිවේදනය)**
  - බියර් සහ සැර මත්පැන් මත අයකරනු ලබන සුරාබදු අනුපාතය සංශෝධනය කිරීම.

- **සුරා බදු නිවේදන අංක 981 (2015.12.04 දිනැති අංක 1943/16 දරන ගැසට් නිවේදනය )**
  - බියර් මත අයකරනු ලබන සුරාබදු අනුපාතය සංශෝධනය කිරීම.

- **සුරා බදු නිවේදන අංක 982 ( 2015.12.15 දිනැති අංක 1945/8 දරන ගැසට් නිවේදනය )**
  - කිරිපොන්සා,වයින්, බියර්, සහ අරක්කු සඳහා මධ්‍යසාර සැර ප්‍රමාණය සීමා කිරීමට අවශ්‍ය විධිවිධාන සකස් කිරීම.

- **සුරා බදු නිවේදන අංක 983, 984 ( 2015.12.15 දිනැති අංක 1945/17 දරන ගැසට් නිවේදනය)**
  - මත්පැන් නිෂ්පාදනය සහ ස්කාගාර මත අයකරනු ලබන වාර්ෂික බලපත්‍ර ගාස්තු සහ තොග හා සිල්ලර අලෙවිසැල්, හෝටල්, හෝටල් පිඨිකා,තානායම් ආදියෙහි වාර්ෂික මත්පැන් බලපත් ගාස්තු සංශෝධනය කිරීම.

- **සුරා බදු නිවේදන අංක 985 ( 2015.12.31 දිනැති අංක 1947/41 දරන ගැසට් නිවේදනය )**
  - විදේශ මත්පැන්, ප්‍රවාහනය සහ සිල්ලර වෙළඳාම සඳහා සීමා කිරීම් පැනවීම.
- **සුරා බදු නිවේදන අංක 986 ( 2015.12.31 දිනැති අංක 1947/42 දරන ගැසට් නිවේදනය )**
  - හෝටල් සහ බූටික් හෝටල් /විලා ආදියෙන් අයවීමට නියමිත අදාල ගාස්තු එකතු කර ගැනීම සඳහා වන උපලේඛන යලි ස්ථාපිත කිරීම.

- **සුරා බදු නිවේදන අංක 987 ( 2015.12.31 දිනැති අංක 1947/43 දරන ගැසට් නිවේදනය )**
  - බෝතල් කල රා සඳහා වූ සුරාබදු අනුපාත ඉහළ නැංවීම.

## III. මුද්දර ගාස්තු

- **2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධි විධාන) පනත, (2015.09.21 දිනැති ගැසට් නිවේදන අංක 1933/14 දරන ගැසට් නිවේදනය )**
  - ඕනෑම දේපලක් මත බලපාන බැඳුම්කර සඳහා වූ මුද්දර ගාස්තු එකතු කිරීම.

**IV. සෙස් බද්ද**

- **1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත ( (2015.11.20 දිනැති අංක 1941/32 දරන ගැසට් නිවේදනය )**
  - ගම්මිරිස්, කරාබුනැටි, කුරුඳුපොතු, සාදික්කා වැනි කුළු බඩු අපනයන කරුවන් දිරිගැන්වීම සඳහා ඒවා මත පැවති අපනයන සෙස් බද්ද ඉවත් කිරීම.

- **1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත (2015.11.20 දිනැති අංක 1941/33 දරන ගැසට් නිවේදනය)**
  - දේශීය කර්මාන්තයන් ආරක්‍ෂා කිරීම සඳහා ආනයනික ඇගළුම් සහ පාවහන් සඳහා ආනයන සෙස් බදු අනුපාත සංශෝධනය කිරීමට සහ ආනයනය කරනු ලබන ස්වර්ණාභරණ සඳහා සියයට 10 ක සෙස් බද්දක් පැනවීම.

- **1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත (2015.12.11 දිනැති අංක 1944/54 දරන ගැසට් නිවේදනය)**
  - මිල උච්ඡාවචනයන් වැලැක්වීම සහ වෙළෙඳපොල තුළ තරඟකාරිත්වය සහතික කිරීම සඳහා බීඩි කොළ, මාළු දැල්, ශීතකරණ සඳහා කැබිනෙට්ටු සහ ලිහිසි තෙල් වල ආනයන සෙස් බදු අනුපාත සංශෝධනය කිරීම.

**V. 2015 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත**

- ආදායම් පරිපාලන හා කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික නිවැරදි කිරීම් හා විධිවිධාන සැලසීම.

**VI. මුදල් පනත**

- **2004 අංක 11 දරන මුදල් පනත (2015.05.18 දිනැති 1915/2 දරන ගැසට් නිවේදනය)**
  - ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු අනුපාතයන් 2016 වර්ෂය දක්වා නියම කිරීම.
- **2004 අංක 11 දරන මුදල් පනත (2015.12.14 දිනැති අංක 1945/2 දරන ගැසට් නිවේදනය)**
  - ජාත්‍යන්තර විදුලි සංදේශ නියාමන බද්ද ඇ.ඩො. ශත 09 සිට ඇ.ඩො.ශත 12 දක්වා වැඩිකිරීම.
- **2015 අංක 10 දරන මුදල් පනත**
  - සුරා බදු ආඥා පනත යටතේ බලපත්‍රලාභී තැබෑරුම් සහ මත්පැන් අලෙවිසැල් වලට රු.250,000 ක එක්වරක් පමණක් ගෙවිය යුතු මත්පැන් අලෙවිසැල් සහ තැබෑරුම් අය බද්දක් පැනවීම.
  - 2013.04.01න් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රු.මිලියන 2,000ට වඩා අධික බදු පෙර ලාභයක් උපයන පුද්ගලයින් හෝ ආයතන මත සුපිරි වාසි බද්දක් පැනවීම (මේ සඳහා බදු ලෙස බදු ආදායමින් සියයට 25ක් අයකරනු ලැබේ)
  - බලපත්‍රලාභී ජංගම දුරකථන ක්‍රියාකරුවන් වෙත එක් වරක් පමණක් ගෙවිය යුතු රු. මිලියන 250 ක ජංගම දුරකථන ක්‍රියාකරු අය බද්ද පැනවීම.
  - චන්ද්‍රිකා වල හිමිකාරත්වය හිමි සහ ශ්‍රී ලාංකික චන්ද්‍රිකා ස්ථාන භාවිතා කිරීමට අවසර ලැබූ අය සඳහා එක්වරක් පමණක් ගෙවිය යුතු රු.මිලියන 1,000ක චන්ද්‍රිකා ස්ථාන අය බද්ද පැනවීම.

- 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත යටතේ ක්‍රියාත්මක වන ක්‍රීඩා සඳහා පමණක් වෙන්වූ නාලිකා සඳහා එක් වරක් පමණක් ගෙවිය යුතු රු. මිලියන 1,000 ක ක්‍රීඩා සඳහා වෙන්වූ නාලිකා අයබද්දක් පැනවීම.
- මුදල් පනත යටතේ අර්ථ දක්වා ඇති සුඛෝපභෝගී නිවෙස් හිමියන්ගෙන් වාර්ෂිකව අයකරගනු ලබන රු.මිලියන 1 ක මන්දිර බද්දක් පැනවීම.
- කැසිනෝ ව්‍යාපාරයේ නියුක්ත වී සිටින ව්‍යාපාරිකයන්ගෙන් එක් වරක් පමණක් අයකරනු ලබන රු. මිලියන 1,000 ක කැසිනෝ කර්මාන්ත බද්දක් පැනවීම.
- ශ්‍රී ලාංකික පුරවැසියන් ස්ථිර පදිංචිය සඳහා විදෙස් ගත වන විට ඔවුන් රටින් පිටතට රැගෙන යනු ලබන විදේශ විනිමය මත සියයට 20ක විගමන බද්දක් පැනවීම.
- මෝටර් රථ ආනයනකරුවන්ගෙන් වාර්ෂිකව රු. මිලියන 1.5ක් බැගින් අයකරන වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කරන ලදී.

**VII. ඔට්ටු සහ සූදු බදු පනත**

- **2015 අංක 14 දරන ඔට්ටු සහ සූදු බදු (සංශෝධිත) පනත**
  - ඔට්ටු සහ සූදු ව්‍යාපාර මගින් ලබා ගන්නා දළ ආදායම මත අයකරගත් සියයට 5 ක ඔට්ටු සහ සූදු බදු ආදායම සියයට 10 දක්වා ඉහල දැමීම සහ කැසිනෝ විනෝද ශාලාවලට ඇතුලත්වන සෑම පුද්ගලයෙක්ගෙන්ම ඇ.ඩො.100 ක ඇතුල්වීමේ ගාස්තුවක් හඳුන්වාදීම.

**VIII. එකතු කළ අගය මත බදු පනත**

- **2015 අංක 11 දරන එකතු කළ අගය මත බදු (සංශෝධිත) පනත**
  - එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 12 සිට සියයට 11 දක්වා අඩු කිරීම.
  - තොග හා සිල්ලර වෙළදාමට එකතු කළ අගය මත බදු අය කිරීම සඳහා පැවතිය යුතු කාර්තුවක් සඳහා විකුණුම් වටිනාකම රු.මිලියන 250 සිට රු.මිලියන 100 දක්වා අඩු කිරීම.
  - එකතු කළ අගය මත බද්ද යටතේ ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය බද්දට යටත් සැපයුම් සීමාව වර්ෂයකට රු. මිලියන 12 සිට වර්ෂයකට රු.මිලියන 15 දක්වා වැඩිකිරීම.
  - ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නම් කරන ලද වරායන් තුළ පමණක් භාවිතා කිරීම සඳහා ආනයනය කරනු ලබන යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ අමතර කොටස් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම.
  - එකතු කළ අගය මත බද්දෙන් නිදහස් නියැදි වටිනාකමේ සීමාව රු.25,000 සිට රු. 50,000 දක්වා වැඩි කිරීම.

**IX. 2015 අංක 12 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධිත) පනත**

- ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් නියැදි වටිනාකමේ සීමාව රු.25,000 සිට රු. 50,000 දක්වා වැඩි කිරීම.
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නම් කරන ලද වරායන් තුළ පමණක් භාවිතා කිරීම සඳහා ආනයනය කරනු ලබන යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ අමතර කොටස් ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කිරීම.
- ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් පිරිවැටුම් සීමාව කාර්තුවකට රු. මිලියන 3 සිට කාර්තුවකට රු. මිලියන 3.75 දක්වා වැඩි කිරීම.

**X. 2015 අංක 9 දරන ආදායම් බදු (සංශෝධිත) පනත**

- උපයන විට ගෙවීමේ බද්දෙන් නිදහස් සීමාව රු.600,000 සිට රු.750,000 දක්වා වැඩිකිරීම.

- උපයන විට ගෙවන බද්දේ උපරිම බදු අනුපාතය සියයට 24 සිට සියයට 16 දක්වා අඩු කිරීම.
- සියයට 12 ක සහනදායී අනුපාතය සඳහා සුදුසුකම් ලබන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ වාර්ෂික පිරිවැටුම් සීමාව රු. මිලියන 500 සිට රු. මිලියන 750 දක්වා වැඩි කිරීම.
- කෘෂිකාර්මික අංශයට ලබාදෙන සියයට 12ක සහනදායී අනුපාතය දේශීය සීනි කර්මාන්තය සඳහාද ලබාදීම.
- තනි පුද්ගලයින්ගේ පොලී ආදායම මත අවසාන බද්දක් ලෙස සියයට 2.5ක රඳවා ගැනීමේ බද්දක් පැනවීම.
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ඉතුරුම් සඳහා වූ පොලී ආදායම රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කිරීම.

**XI. 2006 අංක 10 දරන ආදායම් බදු පනත (2015.03.25 දිනැති අංක 1907/18 දරන ගැසට් නිවේදනය)**

- අඡ් ෂිපා සංවිධානය අනුමත පුණ්‍ය ආයතනයක් ලෙස නිවේදනය කිරීම.

**XII. 2003 අංක 03 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත**

- **2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 10 පරිච්ඡේදය යටතේ කරන ලද නියෝග (2015.10.02 දිනැති අංක 1934/34 දරන ගැසට් නිවේදනය)**
  - 2015 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම.
- **2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 16 පරිච්ඡේදය යටතේ කරන ලද නියෝග (2015.10.02 දිනැති අංක 1934/35 දරන ගැසට් නිවේදනය)**
  - 2015 පූර්ව මැතිවරණ අය වැය තත්ත්වය පිළිබඳ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම.
- **2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 13 පරිච්ඡේදය යටතේ කරන ලද නියෝග (2015.10.23 දිනැති අංක 1937/26 දරන ගැසට් නිවේදනය)**
  - 2014 අවසාන අය වැය තත්ත්වය පිළිබඳ වාර්තාව (වාර්ෂික වාර්තාව) - 2014 ප්‍රකාශයට පත් කිරීම.
- **2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 4 සහ 9 පරිච්ඡේද යටතේ කරන ලද නියෝග (2015.11.20 දිනැති අංක 1941/28 දරන ගැසට් නිවේදනය)**
  - 2016 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම.

## 2.4 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ අදාල වාර්තා ප්‍රකාශයට පත් කිරීම.

- **වාර්ෂික වාර්තාව -2014**
  මුදල් වර්ෂය අවසාන වී මාස 05ක් ඉක්ම යාමට මත්තෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර මහජනතාවට නිකුත් කළයුතු අවසාන අය වැය තත්වය පිළිබද වාර්තාව එනම් 2014 වාර්ෂික වාර්තාව, 2015 මැයි මස දී ප්‍රකාශයට පත් කෙරිණි.

- **වසර මැද රාජ්‍ය මූල්‍ය තත්වය පිළිබද වාර්තාව -2015**
  මෙම වාර්තාව අදාළ වර්ෂයේ ජුනි මස අවසාන දිනට හෝ විසර්ජන පනත සම්මත වීමෙන් මාස 06ක් ඉක්ම යාමට පෙර යන කාල පරිච්ඡේද දෙකෙන් පසුව එළඹෙන දිනට ප්‍රථම, සෑම

වසරකම නිකුත් කළ යුතු අතර, ඒ අනුව, 2015 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව 2015 ජුනි මස ප්‍රකාශයට පත් කරන ලදී.

- **පූර්ව මැතිවරණ අයවැය තත්වය පිළිබඳ වාර්තාව-2015**

  පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම පිණිස මහ මැතිවරණයක් පවත්වන බවට ප්‍රකාශයක් හෝ නියෝගයක් නිකුත් කිරීමෙන් සති තුනක් ඇතුළත මෙම වාර්තාව ප්‍රකාශයට පත් කළ යුතු වේ. ඒ අනුව, 2015 අගෝස්තු මස පැවති මහ මැතිවරණය සඳහා පූර්ව මැතිවරණ අය වැය තත්වය පිළිබඳ වාර්තාව 2015 ජුලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී .

- **රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව- 2016**

  2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 04,05 සහ 06 වන වගන්ති යටතේ ඉදිරිපත් කෙරෙන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය වාර්තාව 2015 සහ 07,08 සහ 09 වගන්ති යටතේ ඉදිරිපත් කළ යුතු අයවැය, ආර්ථිකය සහ රාජ්‍ය මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව 2016 යන වාර්තා 02න් සමන්විත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2015 ඔක්තෝම්බර් මස ප්‍රකාශයට පත් කරන ලදී.

## 3. පාලන හා ගිණුම්

### 3.1 සංවිධාන ව්‍යුහය

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව අනුමත කාර්ය මණ්ඩලය 65 කින් සමන්විත වේ. ඒ අනුව පහත සඳහන් සේවක මඩුල්ල දෙපාර්තමේන්තුව තුළ සේවය කරනු ලබයි.

**වගුව 3: සේවක සංඛ්‍යා විස්තර - 2015 (2015.12.31 දිනට)**

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී.ලං.ප.සේ. | 01 | 01 | - |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී.ලං.ප.සේ. | 01 | - | 01 |
| අධ්‍යක්ෂ<br>ශ්‍රී.ලං.ප.සේ.<br>ශ්‍රී.ලං.ක්‍ර.සේ. | 02 | - | 02 |
| | 01 | 01 | - |
| ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥ | 01 | - | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී.ලං.ප.සේ. | 09 | 07 | 02 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී.ලං.ක්‍ර.සේ. | 04 | 04 | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී.ලං.ග.සේ. | 01 | - | 01 |
| ආර්ථික විද්‍යාඥ | 01 | - | 01 |
| සංඛ්‍යා ලේඛනඥ | 01 | - | 01 |
| පරිපාලන නිලධාරී | 01 | 01 | - |
| භාෂා පරිවර්තක | 02 | 01 | 01 |
| සංවර්ධන නිලධාරී | 06 | 03 | 03 |
| පර්යේෂණ සහකාර | 06 | 03 | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 13 | 12 | 01 |
| රියදුරු | 06 | 04 | 02 |
| කා.සේ.සේ. | 09 | 06 | 03 |
| **එකතුව** | **65** | **43** | **22** |

### 3.2 කාර්ය මණ්ඩල පුහුණු කිරීම

#### 3.2.1. දේශීය පුහුණු

**වගුව 4: දේශීය පුහුණු-2015**

| නම | තනතුර | පුහුණු පාඨමාලාව | කාල සීමාව |
|---|---|---|---|
| එස්.පී. කිරිවත්තුඩුවගේ මයා | සහකාර අධ්‍යක්ෂ | පශ්චාත් උපාධි පාඨමාලාව ආරක්ෂක අංශ සහ මාණ්ඩලික විද්‍යාලය, සපුගස්කන්ද | 2015 ජනවාරි 01 සිට දෙසැම්බර් 17 දක්වා |
| ආර්.එම්.කේ.එම්. ලක්මිණී මිය | සහකාර අධ්‍යක්ෂ | Applied Econometrics practical approach using e views software, ශ්‍රී ලංකා මහ බැංකුව, රාජගිරිය | 2015 ජනවාරි 21 සිට මැයි 22 දක්වා |
| කේ.එම්. කුමාරසිරි මයා | සහකාර අධ්‍යක්ෂ | Basic Economectrics, ශ්‍රී ලංකා මහ බැංකුව, රාජගිරිය | 2015 පෙබරවාරි 21 සිට අප්‍රේල් 21 දක්වා |
| කේ.එම්. කුමාරසිරි මයා | සහකාර අධ්‍යක්ෂ | Master of Financial Economic, කොළඹ විශ්ව විද්‍යාලය | 2015 අප්‍රේල් සිට |
| එම්.පී.ආර්.එස්. ධනපාල මෙය | රාජ්‍ය කළමනානරණ සහකාර | Government Accounting Procedure-SLIDA | 2015 ඔක්තෝම්බර් 16 |

### 3.2.1. විදේශීය පුහුණු හා සම්මන්ත්‍රණ

වගුව 5: විදේශීය පුහුණු හා සම්මන්ත්‍රණ -2015

| නම | තනතුර | පුහුණු පාඨමාලාව | කාල සීමාව |
|---|---|---|---|
| ජී.කේ. සෙනවිරත්න මයා | අධ්‍යක්ෂ ජනරාල් | Driving Government Performance Leadership Strategies that produce result -USA | 2015 සැප්තැම්බර් 20 සිට 25 දක්වා |
| ජී.කේ. සෙනවිරත්න මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 1st session of the Economic & Social Commission for Asia & Pacific (ESCAP)-Thailand | 2015 මැයි 24 සිට මැයි 30 දක්වා |
| එම්.කේ.සී. සේනානායක මයා | අධ්‍යක්ෂ | 6th High Level tax conference for Asian countries - Tokyo | 2015 අප්‍රේල් 07 සිට 09 දක්වා |
| ඩබ්.ටී.ජී. පෙරේරා මිය | බදු උපදේශක | International Tax Dialogue Conference 2015 Paris- France | 2015 ජුලි 01 සිට 03 දක්වා |
| ඩබ්.ටී.ජී. පෙරේරා මිය | බදු උපදේශක | Capacity Building for Tax Administration | 2015 දෙසැම්බර් 08 සිට 09 දක්වා |
| ආර්.එම්.ආර්.එස්.බී. දිසානායක මයා | සහකාර අධ්‍යක්ෂ | 6th High Level tax conference for Asian countries - Tokyo | 2015 අප්‍රේල් 07 සිට 09 දක්වා |
| කේ.කේ.අයි. එරන්ද මයා | සහකාර අධ්‍යක්ෂ | Strategy of Free trade zone for Developing countries - 2015- China | 2015 ජුලි 01 සිට 21 දක්වා |
| කේ.කේ.අයි. එරන්ද මයා | සහකාර අධ්‍යක්ෂ | Training work shop on Regional Economic and Financial Monitoring - Korea | 2015 ඔක්තෝම්බර් 12 සිට 23 දක්වා |
| ජේ.ජී.ඩී.ආර්. ජයසූරිය මිය | සහකාර අධ්‍යක්ෂ | Import & Export food inspection officials for Developing Countries - China | 2015 සැප්තැම්බර් 08 සිට 28 දක්වා |
| එම්.ජී.සී.එන්. සෙනෙවිරත්න මිය | සහකාර අධ්‍යක්ෂ | 7th KEI Student Paper Competition- Korea | 2015 දෙසැම්බර් 16 සිට 18 දක්වා |
| ජේ. චන්ද්‍රමෝහන් මිය | සහකාර අධ්‍යක්ෂ | Cooperation in Industrial Park Constructed between China and Asian countries-China | 2015 මැයි 27 සිට ජුනි 18 දක්වා |
| එච්.ඩී.ජී. රුක්ෂිණී මෙය | සහකාර අධ්‍යක්ෂ | Introduction and Utilization of Foreign Capital of Inland Regions for Developing Countries - China | 2015 ඔක්තෝම්බර් 21 සිට නොවැම්බර් 10 දක්වා |
| ඩී.එම්.එස්.ජී. නිරෝෂණ මයා | සහකාර අධ්‍යක්ෂ | Public Finance Management - Singapore Qatar Regional Training | 2015 ජනවාරි 25 සිට 30 දක්වා |
| ඩී.එම්.එස්.ජී. නිරෝෂණ මයා | සහකාර අධ්‍යක්ෂ | Custom Valuation and Risk Management in Mumbai - India | 2015 පෙබරවාරි 01 සිට 07 දක්වා |
| ඩී.එම්.එස්.ජී. නිරෝෂණ මයා | සහකාර අධ්‍යක්ෂ | Master Degree Programme in Public Policy in Japan - JDS | 2015 අගෝස්තු 16 සිට 2017 ඔක්තෝම්බර් 16 දක්වා |
| කේ.එම්.කුමාරසිරි මයා | සහකාර අධ්‍යක්ෂ | Economic Growth Mode and Sustainable Development for Developing Countries - China | 2015 ජුනි 02 සිට 24 දක්වා |
| ආර්.එම්.කේ.එම්. ලක්මිණී මිය | සහකාර අධ්‍යක්ෂ | China's Economic and Social Development Experience for Euro Asian Countries - 2015 -China | 2015 ජුලි 01 සිට 21 දක්වා |
| සී.කේ. විතාන මිය | සංවර්ධන සහකාර | Economic Development - China | 2015 සැප්තැම්බර් 09 සිට 15 දක්වා |

## 3.3 මූල්‍ය පරිපාලනය

### 3.3.1 අයවැය ප්‍රතිපාදන යොදා ගත් ආකාරය

2015 වර්ෂය සඳහා 238 ශීර්ෂය යටතේ මෙම දෙපාර්තමේන්තුවට අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර එම ප්‍රතිපාදන යොදාගත් ආකාරය පහත දැක්වේ.

**වගුව 6: අයවැය ප්‍රතිපාදන යොදා ගත් ආකාරය- 2015**

| වියදම් විස්තරය | 2015 ඇස්තමේන්තු (රුපියල්) | 2015 ශුද්ධ ප්‍රතිපාදන (රුපියල්) | 2015 තථ්‍ය වියදම (රුපියල්) |
|---|---|---|---|
| **පුනරාවර්ථන වියදම්** | **75,880,000** | **75,880,000** | **70,433,830.42** |
| පුද්ගල පඩිනඩි | 25,500,000 | 27,800,000 | 25,568,069,64 |
| ගමන් වියදම් | 2,100,000 | 3,900,000 | 3,760,902.32 |
| සැපයීම් | 2,480,000 | 2,480,000 | 1,644,473.96 |
| නඩත්තු වියදම් | 3,000,000 | 3,270,000 | 2,747,614.31 |
| ගිවිසුම්ගත සේවා | 42,300,000 | 37,780,000 | 36,088,820.43 |
| මාරු කිරීම් හා වෙනත් | 500,000 | 650,000 | 623,949.76 |
| **මූලධන වියදම්** | **2,500,000** | **2,500,000** | **2,226,826.50** |
| පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් | - | - | - |
| අත්පත්කර ගැනීම් | 2,000,000 | 2,000,000 | 1,958,726.50 |
| ප්‍රාග්ධන මාරු කිරීම් | - | - | - |
| හැකියා වර්ධනය | 500,000 | 500,000 | 268,100.00 |
| **මුළු වියදම** | **78,380,000** | **78,380,000** | **72,660,656.92** |

### 3.3.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

2015 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ විස්තර පහත දැක්වේ.

**වගුව 7: රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම**

| විස්තරය | අනුමත සීමාව (රුපියල්) | තථ්‍ය සීමාව (රුපියල්) |
|---|---|---|
| 1. උපරිම වියදම් සීමාව | 2,715,000 | 2,134,369.50 |
| 2. අවම ලැබීම් සීමාව | 1,000,000 | 3,257,060.23 |
| 3. උපරිම හර ශේෂ සීමාව | 10,000,000 | 6,556,104.63 |

### 3.3.3 විගණන විමසුම

2015 වර්ෂය තුළ මුදල් අමාත්‍යාංශයේ කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ විගණන විමසුම් 07 කට සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ලද විගණන විමසුම් 07 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

**සංවිධාන ව්‍යුහය -2015**

